| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 8 ශ්‍රේණිය | **නර්තනය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

## I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. නම්‍යතා අභ්‍යාස වලදී සිදුකරනු ලබන චලන ............ යනුවෙන් වර්ග කර දැකිය හැකිය.
    i. පා සරඹ, ගොඩ සරඹ
    ii. අත් සරඹ, දණ්ඩි සරඹ
    iii. ස්ථිතික චලන, සංචාරී චලන
    iv. තාලානුකුල චලන, රිද්මයානුකුල චලන

2. සත්ව චරිතයක් නර්තන මධ්‍යයෙන් නිරූපණය කිරීමේ දී ............. පිළිබඳ අවබෝධය වඩාත් වැදගත් ය.
    i. චර්යා ලක්ෂණ
    ii. ශරීරයේ දක්නට ලැබෙන වර්ණ
    iii. පරිසරය
    iv. අභ්‍යන්තර සමාරෝපය

3. 'තෙයි' යන පද මූලික කොටගෙන ඇත්තේ,
    i. ගොඩ සරඹ වලදී
    ii. බෙර වාදනයේදී
    iii. අඩව් නර්තනයේදී
    iv. පා සරඹ නර්තනයේදී

4. නර්තනයට අධිපති දෙවියන් වන්නේ
    i. සරස්වතී දෙවියන්
    ii. ශිව දෙවියන්
    iii. පාර්වතී දෙවියන්
    iv. ක්‍රිෂ්ණා දෙවියන්

5. අවකාශය ප්‍රධාන වශයෙන් කොටස් ............. කට බෙදේ.
    i. 02
    ii. 04
    iii. 03
    iv. 10

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.**

(නාද මාලාව / නුහුරු අඩිය / දෑල අඩිය / ලම්භ ලය / රූකම් / දණ්ඩිකඳ / මූලික බීජාක්ෂර)

6. උඩරට නර්තන සම්ප්‍රදායේ හත්වන පා සරඹයේ සරඹ නාමය …………………….. ලෙස හැඳින්වේ.
7. පුරා විද්‍යා මූලාශ්‍ර යටතේ …………………….. ඇසුරෙන් නර්තන කලාවක් පැවති බවට සාධක හඳුනාගත හැකිය.
8. වන්නමක තානම මඟින් එහි …………………….. හඳුනාගත හැකිය.
9. සමගුණ ලෙස හඳුන්වන්නේ …………………….. යි.
10. 'තත්, ජිත්, තොං, නං' ගැට බෙරයේ …………………….. වේ.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වගන්ති හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

11. ජිං ගත ගො ගො බෙර පදය 12/123 තාල රූපයට අයත් බෙර පදයකි. (   )
12. සිංහරාජ වන්නම අයත් තාල රූපය වන්නේ (   )
13. මණ්ඩිපද, පා සරඹ තුළින් පාද චලන හුරු කෙරේ. (   )
14. ඇල සරඹ යනු පස්වන ගොඩ සරඹ නාමයයි. (   )
15. පතුරු කවි තුළින් ගුරු භක්තිය මනාව ඉස්මතු කෙරේ. (   )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | |
|---|---|
| 16. කායික හා මානසික ශක්තීන් වර්ධනය කිරීම | වන්නම් |
| 17. නර්තන චලන සිදු කිරීමේදී වැඩි අවධානය | සවරං |
| 18. ඊශ්වර දෙවියන් හා කෙහෙතු අතර පැවති සංවාදය මැණිකකට උපමා කිරීම | අංග |
| 19. සූරිය දෙවි රජුනි අවසර දෙවන් මට | නමස්තා අභ්‍යාස |
| 20. සම්ප්‍රදායන් තුනටම පොදු ශාස්ත්‍රීය ගායනයකි | වෛරොඩි |

(ල. 20)

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

1.

i. නර්තනය මඟින් චලන දැක්විය හැකි සත්ව චරිත 04ක් නම් කරන්න. (ල. 2)

ii. භය නැමැති ස්ථායි භාවයෙන් උපදින රසය ලියන්න. (ල. 2)

iii. ප්‍රස්තාරකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල. 2)

iv. නම්‍යතා අභ්‍යාස සිදුකිරීමේ දී අත්වන වාසි දෙකක් ලියන්න. (ල. 2)

v. භාව ප්‍රකාශනයේදී මූලික වන ශරීර කොටස් දෙකක් ලියන්න. (ල. 2)

2.

i. වෛරොඩි වන්නමේ බෙර පදය හා තාල රූපය ලියන්න. (ල. 4)

ii. සවරන් කවියක් හෝ පතුරු කවියක් නියමිත තාල රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 6)

3.

i. ''සිරසපාද කවි'' කෙටියෙන් හඳුන්වන්න. (ල. 4)

ii. ඔබ කැමති සිරසපාද කවියක් සහ මල් යහන් කවියක් ලියන්න. (ල. 6)

4.

i. පහතරට බෙරය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න. (ල. 4)

ii. පහතරට බෙරයක රූප සටහනක් ඇඳ කොටස් 04ක් නම් කරන්න. (ල. 6)

5.

i. නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු අනාවරණය කර ගත හැකි මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ල. 4)

ii. ආගමික අවස්ථා සඳහා නර්තනය යොදාගත් බවට සාධකයක් ලියන්න. (ල. 3)

iii. දේශීය නර්තන කලාවට භාරතීය ආභාෂය ලැබුණු බව සාධකයක් ලියන්න. (ල. 3)

6.

i. නවරාත්‍රී උත්සවය කෙටියෙන් හඳුන්වන්න. (ල. 4)

ii. එහිදී පුද ලබන දෙවිවරු නම් කරන්න. (ල. 3)

iii. ''විජය දසම්'' පූජාවේ දී සිදු කරනු ලබන චාරිත්‍රය කුමක්ද? (ල. 3)